02

**Samōdhāna: The Journal of Faculty of Social Sciences and Humanities**
2016, Vol. 5 (II) 11-28pp
© The Author 2016
Ed. *Chandana Rohana Withanachchi*
Pub. *Publication Section of the Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka, Mihintale.*
ssh.samodhana@gmail.com

# ශ්‍රී ලාංකේය දේශපාලන වෙනස්වීම්වල සංධිස්ථානයක් ලෙස 1915 සිංහල මුස්ලිම් ගැටුම බලපෑ ආකාරය පිළිබඳ විමසුමක්

ඩී.ජේ.කේ. ඉහළගෙදර[1]

## Abstract

The main objective of this research is to examine the political changes which took place in Sri Lanka during the period from 1915 to 1919. In this study, a special attempt is made to examine the nature of the provincial leadership and the activities of provincial organization which had not been covered by previous studies. The period between 1915 and 1919 is a decisive period in the political and constitutional history of the country.The aftermath of the Sinhala-Muslim riots of 1915, particular the serve suppressive policy adopted by the Colonial Government resulted in a change of the attitude of the local leadership towards the policy of the British Government. The local leaders were convinced that they must unite and organize themselves and needed a strong political organization in order to with their demands. The main result of this tendency was the establishment of the Ceylon National Congress. The national movement of Sri Lanka was centered around the Ceylon National Congress since its establishment.In this study an attempt was made to examine two main research problems:Was the political reform movement at the time concerned mainly with the needs and the interests

[1] *කථිකාචාර්ය, මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.*

of the elite class or not? Were there local leaders and organizations who participated in or contributed to the political reform movement?This study makes it clear that the elite class was not the decisive factor in making political changes during the relevant period. It is true that the social elite took the leadership of the Ceylon National Congress. But there were many organizations which did not accept the thinking and the line of action of the Ceylon National Congress.

**Keywords**: Colonial, Elite, Leadership, National, Provincial

## ශැඳින්වීම

1915 සිට 1919 දක්වා කාල පරිච්ඡේදයේ ශ්‍රී ලංකාවේ දේශපාලන වෙනස්වීම් පිළිබඳව අවධානය යොමු කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණයි. 1915-1931 දක්වා කාල පරිච්ඡේදය ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසයේ තීරණාත්මක සන්ධිස්ථානයකි. විශේෂයෙන්ම 1915 සිංහල මුස්ලිම් ගැටුම (1915 Riots) බ්‍රිතාන්‍ය යටත් විජිත ආණ්ඩුව විසින් මර්ධනය කිරීමෙන් මතු වූ තත්ත්වය දේශීය නායකත්වය විසින් මෙතෙක් යටත්විජිත ක්‍රියාකාරිත්වය පිළිබඳව දැක්වූ අදහස්වල වෙනස් ප්‍රවණතාවක් ඉස්මතු කිරීමට හේතු විය.මෙහිදී 1915 සිට 1919 දක්වා ශ්‍රී ලංකාවේ දේශපාලන වෙනස්වීම් පිළිබඳ සිදුකරන ලද අධ්‍යනයේ දී ක්ෂේත්‍ර ගණනාවක් කෙරෙහි අවධානය යොමු කරන ලදී. එහි දී හඳුනාගත හැකි පොදු නිගමනය වූයේ ඉහත කාලපරිච්ඡේදයේ දේශපාලන වෙනස්විම් කෙරෙහි ලාංකේය ප්‍රභූ පන්තිය තීරණාත්මක බලවේගය නොවූ බවයි. දේශපාලන නායකත්වය තුළ ධනේෂ්වර පන්තියේ කාර්යභාරය ලංකා ජාතික සංගමයට සීමා වූ බව පැහැදිලි කරුණකි. දේශීය පුනර්ජීවන ව්‍යාපාරය හා අමද්‍යප ව්‍යාපාරය ඔස්සේ සමාන්‍ය ජනයා දේශපාලන කරුණු හා පෙළ ගැසෙන්නට වූහ. එහි නායකත්වය ප්‍රභූ කණ්ඩායම් විසින් හොබවන ලදී. 1915න් පසු සිදුවන දේශපාලන පරිවර්තනයේ දී ලංකා ජාතික සංගමයේ මතවාදය නොපිළිගත් බහුවිධ සංවිධාන ගණනාවක් තිබූ බව හඳුනාගත හැකි වේ. ඔවුන්ගේ දායකත්වය අධිරාජ්‍ය විරෝධී අරගලය ප්‍රාණවත් කිරීමට සමත් විය. නමුත් මෙහි දී ලංකා ජාතික සංගමයේ ක්‍රියාකාරිත්වය ලඝු කොට සැලකිය නොහැකි බව පැහැදිළි වනුයේ ලාංකේය යන සංකල්පය තුළ සාමුහිකත්වය පදනම් කොටගත් පොදුජන නියෝජනයේ ආරම්භක අවස්ථාව ලෙස සැලකිය හැකි හේතුව මතයි.

## 1915 සිංහල මුස්ලිම් ගැටුම

1915 සිංහල-මුස්ලිම් කෝලහාලය යනුවෙන් හඳුන්වන සිද්ධිදාමයට සම්බන්ධ වූයේ සිංහල හා මුස්ලිම් ජාතිකයන්ය. මෙයට ආසන්නතම හේතුන් නිර්මාණය වූයේ බෞද්ධ පෙරහැරවල් සම්බන්ධයෙන් ආණ්ඩුව පැනවූ නියෝගයක් මුල් කරගෙනයි (මෙත්තානන්ද, 2012:265). බෞද්ධ පෙරහැරවලට මුස්ලිම් දේවස්ථාන අසලදී බෙර ගැසීම ආදී ශබ්ද කිරිම නතර කළ යුතු යැයි ආණ්ඩුව විසින් නියෝගයක් නිකුත් කරන ලදි. මෙම නියෝගයත් සමඟ සිංහල බෞද්ධයින් හා මුස්ලිම් ජාතිකයන් අතර පෙරහැර සම්බන්ධ වූ ආරවුලක් 1915 සිංහල මුස්ලිම් කෝලහාලයට ආසන්නතම සිදුවීම විය. එහෙත් මෙම කෝලහාලය දෙස විචාරාත්මකව බැලීමේදී පෙනී යන්නේ 1915 සිංහල මුස්ලිම් ගැටුමට පෙරහැර සම්බන්ධ සිද්ධියට යටින් දිවෙන අනේක විධ සිද්ධි දාමයක් ද පසුබිම සකස් කර දී තිබුණු බවය. විශේෂයෙන් මේ කාලපරිච්ජේදය තුළ දේශපාලන ජාතික වාදයට පසුබිම සැපයූ ආගමික ජාතික වාදයේ ප්‍රධාන භූමිකාව රඟ දැක්වූයේ සිංහල බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයයි (දේවසිරි 2012:405). බෞද්ධ පුනර්ජීවනය නිසා බෞද්ධයින් අතර ඇතිව තිබූ ප්‍රබෝධයද කිසියම් බලපෑමක් කළ බවට විශ්වාස කෙරේ. සිංහල මුස්ලිම් කෝලහාලයේදී සිදු වූයේ මෙම ජාතික වාදී හැඟීම් යම් යම් ආර්ථික-සමාජයීය සාධකයන් මත ආගමික ගැටුමක ස්වරූපයෙන් මුස්ලිම්වරුන්ට විරුද්ධව පුපුරා යාමය.

දශක ගණනාවක් තිස්සේ වර්ධනය වූ බෞද්ධ උද්සෝෂණ ව්‍යාපාරය තුළින් බෞද්ධයා ප්‍රාණවත් කළ අතර බෞද්ධ උද්සෝෂණය එහි මූලික අරමුණු ගණනාවක් දිනා ගන්නට ද සමත් විය. ආරම්භක අවස්ථාවේ බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරයේ අරමුණ වූයේ ක්‍රිස්තියානීකරණය වැලැක්වීමය (බණ්ඩාර 2007:201). ඒ සඳහා බෞද්ධ පාසල් ගණනාවක් දිවයින පුරා ආරම්භ කෙරිණි. කාලයක් ගත වන විට රාජ්‍ය ප්‍රතිපත්ති වෙනස් වීමත් සමඟ මෙම බෞද්ධ පාසල් ද මිෂනාරි පාසල් හා සමාන අයිතිවාසිකම් ලබන්නට සමත් වූයේය. සංස්කෘතික ජාතිකවාදයක් ලෙස ඇරඹි බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය ආර්ථික ජාතිකවාදය වෙත තල්ලු කිරීමට අනගාරික ධර්මපාල වැන්නන් උත්සුක වූහ (දේවසිරි 2012:408). එමෙන්ම ඊට අවශ්‍ය පන්නරය බෞද්ධ පුවත් පත් වලින් ද ලබා දුණි. මේ අවධියේ බෞද්ධ ව්‍යාපාරිකයෝ බෞද්ධ උද්සෝෂණ ව්‍යාපාරය ව්‍යාපාරික කටයුතු වල දියුණුව සඳහා උපස්ථම්භ කරගන්නට යුහුසුළු වූ අසිංහල වෙළෙඳුන්ට පහර ගසන හා ඔවුන් විවේචනය කරන ප්‍රතිපත්තියක නිරත වූහ (බණ්ඩාර 2007:201).

මේ කාලපරිච්ජේදයේ දී සිංහල ව්‍යාපාරිකයන් සමඟ ප්‍රධාන වශයෙන් තරඟ කළේ මුස්ලිම් ව්‍යාපාරිකයන් වූ අතර ද්‍රවිඩ ව්‍යාපාරිකයන් ද වෙළඳ කටයුතු වල යෙදුණි. මේ නිසා සිංහල ව්‍යාපාරිකයන්ගේ ආර්ථික තත්ත්වය සමෘධිමත් කර ගැනීම උදෙසා මුස්ලිම් වෙළඳුන් වර්ජනය කළ යුතු බව බෞද්ධ පුවත්පත්

පෙන්වා දුණි. මෙලෙස අසිංහල ව්‍යාපාරික විරෝධයකට අවශ්‍ය පදනම ද මේ වන විට සැකසී තිබුණි. මුස්ලිම්වරුන් විසින් තම වෙළඳ ආධිපත්‍යය කුඩා ගම් දක්වා ව්‍යාප්ත කර තිබුණ අතර එහිදී ගැමියන්ට මුස්ලිම්වරුන් විසින් ණයට බඩු භාණ්ඩ සපයනු ලැබීය. ඔවුන්ගේ කූට උපක්‍රමය වූයේ මේ අන්දමින් ගැමියන්ගේ ණය බර තීව්‍ර කොට ගැමියන්ගේ අස්වැන්න හා දේපළ තමන් සතු කර ගැනීමය (දේවසිරි 2012:412). මේ නිසා සිංහල ගැමියන් තුළ මුස්ලිම් ව්‍යාපාරිකයන් කෙරෙහි ඉක්මවා ගිය අප්‍රසාදයක් දැකගත හැකි විය (බණ්ඩාර 2007:203).

මුස්ලිම් වෙළඳුන් ඊට අමතරව ඉඩම් අල්ලා ගැනීම සඳහා ද කූට උපක්‍රම යොදමින් ඒවායේ භුක්තිය තමන් සතු කර ගන්නා ලදී. මුස්ලිම් ව්‍යාපාරිකයන් එදිනෙදා අත්‍යාවශ්‍ය භාණ්ඩ සැපයීමේ ප්‍රමුඛයෝ වූහ. විශේෂයෙන් සහල් පිළිබඳව ඒකාධිකාරියක් ද ඔවුන් සතු විය. මෙම ඒකාධිකාරය පදනම් කර ගෙන භාණ්ඩ මිළ ඉහළ යාම, භාණ්ඩ හිඟ වීම වැනි අවස්ථාවලදී භාණ්ඩ සැඟවීම, මිල හිතුමතේ ඉහල දැමීම, වැනි ක්‍රියාවන් සිදු කළ අතර එවැනි ක්‍රියා නිසා බහුතර සිංහල ජනයා මුස්ලිම්වරුන් කෙරෙහි කලකිරුණු අතර ගැටුම් ද ඇති විය. 1866 දී රටේ සහල් හිඟයක් ඇති වූ අවස්ථාවේ කොළඹ ඇතුළු තවත් නගරවල කලකෝලහල හටගත් අතර කඩ වලට අලාභහානි ද විශාල වශයෙන් සිදු විය. ගාල්ල කටුවැල්ලේදී සිදු වූ කෝලහාල වලදී මුස්ලිම් වෙළඳසැල් කඩා රෙදි සහ සහල් පැහැරගෙන තිබුණි. මේ තත්ත්වය කෑගල්ල, ගම්පහ, නාවලපිටිය වැනි ප්‍රදේශ දක්වා ද පැතිර ගොස් තිබුණි. වැඩි ප්‍රදේශ ගණනාවක කොල්ලකෑමේ තර්ජනය එල්ල වූයේ වතු කම්කරුවන්ගෙනි. මෙම කෝලහල මගින් තදින්ම පහර වැදුනේ මුස්ලිම් ව්‍යාපාරිකයන්ටය. මෙලෙස සිංහල හා මුස්ලිම් ජනතාව ගැටුණු අවස්ථා මෑත කාලීන ඉතිහාසයේ විරල නොවේ. 1884 දී කොළඹ කොටුවේදී සිංහලයන් හා මුස්ලිම්වරුන් අතර බරපතල ගැටුමක් ඇති විය. එහි බැරෑරුම්කම නිසාම ආණ්ඩුව යුද්ධ හමුදාවද එතැනට කැඳවීය. 1855 දී සිංහලයන් හා මුස්ලිම්වරුන් අතර ඇති වූ ගැටුමේදී සිංහලයන් මුස්ලිම්වරුන්ට විරුද්ධව තුවක්කු පාවිච්චි කළ අතර කිහිප දෙනෙක් තුවාල ලැබීය (බණ්ඩාර 2007:203).

1890 දී ගාල්ලේ පෙරහැරක් සම්බන්ධව ද ගැටුමක් ඇති වූ බව වාර්තා වේ. බෞද්ධ උද්සෝෂණ ව්‍යාපාරය මගින් මතු කරන ලද අසිංහල වෙළඳ විරෝධී සටන් පාඨය සාමාන්‍ය ජනතාව අතට සම්ප්‍රේෂණය වීමට ඉහත දී දැක්වූ හේතූන් පදනම සකසා තිබුණි. සිංහල බෞද්ධ ව්‍යාපාරිකයන්ට අවශ්‍ය වූයේ අභ්‍යන්තර ව්‍යාපාරික කටයුතු වල දී මුස්ලිම්වරුන් අභිබවා ප්‍රමුඛත්වය ලබා ගැනීමයි. මේ සඳහා බෞද්ධ උද්සෝෂණ ව්‍යාපාරය ක්‍රියාත්මක අවියක් කර ගැනීමට ඔවුන් පෙළඹුණි. මෙසේ බෞද්ධ උද්සෝෂණ ව්‍යාපාරය අන්තගාමී එකක් වූ අතර මීට සමකාලීනව 1912 අමද්‍යප ව්‍යාපාරයෙන් සිදු වූයේ ඉංග්‍රීසි උගතුන් පුළුල් පදනමක් ගොඩනංවා තිබූ බෞද්ධ උද්සෝෂණ ව්‍යාපාරය සමග සම්බන්ධ වීමෙන් තම පැවැත්ම ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීමය. මේ වන

විට අමද්‍යප ව්‍යාපාරයට ග්‍රාමීය මට්ටමින් පුළුල් පදනමක් ගොඩනැංවී පැවතුණි (දේවසිරි 2012:412).

මෙලෙස සිංහල බෞද්ධ උද්ඝෝෂණ ව්‍යාපාරය මගින් අසිංහල ව්‍යාපාරිකයන්ට එල්ලකළ විරෝධතාවය ද නැගී එමින් තිබූ ආගමික උද්වේගයද, සාමාන්‍ය සිංහල ජනතාව තුළ වූ මුස්ලිම් විරෝධය ද 1915 සිංහල මුස්ලිම් ගැටුමට හේතු පාදක වූ බව ඉඳුරාම පැවසිය හැකිය. එමෙන්ම 1914 පළමුවන ලෝක සංග්‍රාමය ඇති වීමත් සමඟ ශ්‍රී ලංකාවට 1915 වන විට ආර්ථික දුෂ්කරතාව ප්‍රබල ලෙස බලපෑම් කරන්නට පටන් ගත්තේය. ඒ හේතුකොටගෙන රැකියා වියුක්තිය ඇති වූ අතර විශේෂයෙන් කම්කරු පිරිස් පීඩනයට පත් වූහ. මෙලෙස පැන නැගුණු ආර්ථික සහ සාමාජීය බලපෑම් ද 1915 සිංහල මුස්ලිම් කෝලහාලයට වක්‍ර බලපෑමක් එල්ල කළේය (ජයවර්ධන 1978:36).

මෙවන් වටපිටාවක් 1915 සිංහල මුස්ලිම් කෝලහාලයට බලපෑවේය. ඉංග්‍රීසි ආණ්ඩුව විසින් බෞද්ධ පෙරහැර සම්බන්ධව ලද තීන්දුව සම්බන්ධව විවිධ ප්‍රතිවිරෝධතාවයන් 1904 දී පමණ සිට දක්නට ලැබුණි (දේවසිරි 2012:415). 1912 දී ගම්පොල වල්ලහගොඩ පෙරහැර සම්බන්ධව ද මහනුවර දිසාපතිවරයා ආණ්ඩුවේ පෙරහැර සම්බන්ධ කොන්දේසිය බලපවත්වන බව ප්‍රකාශ කළේය. මෙයට විරුද්ධව බෞද්ධයන් ශ්‍රේෂ්ඨාධිකරණයේ පිහිට පැතූ අතර ශ්‍රේෂ්ඨාධිකරණය 1818 දී ආණ්ඩුව නිකුත් කළ ප්‍රකාශනයෙන් අන්‍ය ආගම් වල අයිතිය සුරක්ෂිත කර තිබෙන බවත් බෞද්ධයන්ට අන්‍යාගම්වලට අවහිර කළ නොහැකි බවත් ප්‍රකාශ කළේය (දේවසිරි 2012:412).

ශ්‍රේෂ්ඨාධිකරණය මගින් ප්‍රකාශයට පත් කල මෙම නඩු තීන්දුව බෞද්ධ ජනයා අතර කලකිරීමක් ඇති කිරීමට හේතු විය. බෞද්ධ පුවත්පත් ගණනාවක්ද ශ්‍රේෂ්ඨාධිකරණයේ මෙම තීන්දුවට එරෙහිව පුවත් පළ කරන ලදී. සිංහල ජාතික පුවත් පත සිය කතුවැකියෙන් බෞද්ධ පෙරහැර වලට බාධා කිරීම බෞද්ධයන්ට ඉවසිය නොහැකි ඛේදජනක කරුණකි යනුවෙන් ප්‍රකාශ කළේය. බෞද්ධ පරම විඥානාර්ථ සමාගමේ හා අමද්‍යප ව්‍යාපාරයේ ක්‍රියාකාරී නායකයෝ මෙම නඩු තීන්දුවට තම විරෝධතාව පළකල අතර ඉදිරි ක්‍රියාමාර්ග ගැන සාකච්ඡා කරන ලදී. ඔවුන් විසින් බෞද්ධාරක්ෂක සභාව නමින් සංවිධානයක් පිහිටවූ අතර මේ සම්බන්ධව රාජාධිකරණයට අභියාචනා කළයුතු බව තීරණය කරමින් සී. ඒ. හේවාවිතාරණ, ඩී.ඩබ්. ජයතිලක, ඩී. ආර්. විජේවර්ධන, එම්.ඩබ්.එච්. ද සිල්වා වැනි පුද්ගලයින්ගේ සහභාගීත්වයෙන් මේ සඳහා අරමුදලක් පිහිටු වීමට ද තීරණය කර ගන්නා ලදී (සිල්වා 1996:86)

මේ අවධිය වන විට මුස්ලිම්වරුන්ගේ ක්‍රියා කලාපය ද ආක්‍රමණශීලි ස්වරූපයක් ගෙන තිබුණි. ඔවුන් විසින් මේ කාලයේදී කුරුණෑගල බෞද්ධ පෙරහැරකට පහර දුන් අතර බෞද්ධ ප්‍රතිමා වහන්සේ නමකට ද අලාභහානි සිදු කරන ලදි. මෙහිදී පොලීසිය ක්‍රියාත්මක වී ආරවුලට සම්බන්ධ මුස්ලිම් ජාතිකයන් අත් අඩංගුවට ගෙන නීතිය හමුවට පැමිණ විය. මෙවන් සිදුවීම්

බදුල්ලෙන් හා මහනුවරින් ද වාර්තා වූ අතර මෙලෙස මුස්ලිම්වරුන් ප්‍රකෝපකාරී ලෙස හැසිරීම් බෞද්ධයන්ගේ මුස්ලිම් විරෝධී හැඟීම් උද්දීපනය වීමට පරිසරය සකස් කර දී තිබුණි.

මෙවන් වටපිටාවක් තුළ මහනුවර වෙසක් පෙරහැර වීදි සංචාරය කිරිම 1927 මැයි මස 27 වන දින සිදු විය (බණ්ඩාර 2007:208). පළමු දිනයේදී ආණ්ඩුව පෙරහැර සම්බන්ධව ගෙනා නීතිය පිළිගෙන පෙරහැර වීදි සංචාරය කළ අතර දෙවන දිනයේ දී බෞද්ධ පෙරහැර ගමන් කිරීමේදී මුස්ලිම් දේවස්ථානය අසල රැස්වූ මුස්ලිම් ජනතාව හූ කීම, ගල් මුල් වලින් පහර දීම වැනි නොහොඹිනා ක්‍රියා සිදු කරන ලදී. මේ සිදුවීම්වලට උරණ වූ පෙරහැරකරුවන් මුස්ලිම් දේවස්ථානයටත් එහි සිටි පුද්ගලයන්ටත් පහර දෙන ලදී. පසුව පොලීසිය සම්බන්ධ වී සිදුවීම පාලනය කළද, සිද්ධිය එතැනින් අවසන් වූ බවක් නොපෙනුණි. පසු දින මහනුවර නගරයට විශාල පිරිසක් ඒකරාශී වූයේ දළදා මාලිගයට මුස්ලිම්වරුන් විසින් පහරදීමට සැලසුම් කර ඇති බවට වූ කටකතාවක් පදනම් කරගෙනය. මෙලෙස රැස් වූ සිංහල ජනයා මුස්ලිම්වරුන්ගේ වෙළඳසැල් ඉදිරිපිට ප්‍රකෝපකාරී ලෙස හැසිරෙන්නට වූහ. මහනුවර නගරයේ එක් ස්ථානයකදී මුස්ලිම්වරයෙක් විසින් පාරේ රැස්ව සිටි පිරිසකට කළ වෙඩිතැබීමකින් එක් පුද්ගලයෙක් මිය ගිය අතර සැකකරු අත්අඩංගුවට නොගැනීම නිසා කෝපයට පත් වූ ජනතාව මුස්ලිම් වෙළඳසැල් වලට අලාභහානි කරන්නට පටන් ගත් අතර පසුව එය ක්‍රමයෙන් මංකොල්ලයක් දක්වා දුර ගියේය. මේ වන විට විවිධ පුද්ගලයන් විසින් කටකතා පතුරුවා හැර තිබූ අතර බෞද්ධ වෙහෙර විහාර විනාශ කිරිමට මුස්ලිම්වරුන් සැරසෙන බව හා ඒවා ආරක්ෂා කරගත යුතු බවද දන්වා හැර තිබුණි. එමෙන්ම ආණ්ඩුව විසින්ද මුස්ලිම්වරුන් පන්නා දැමීමට කටයුතු කිරීමට අදහස් කර ඇති බව කියැවුණි. මෙවැනි කටකතා නිසා තත්ත්වය වඩාත් බැරෑරුම් විය. මෙම සිද්ධිදාමයත් සමඟ විවිධ පුද්ගලයින් විසින් තම පෞද්ගලික උවමනාවන් මුදුන්පත් කර ගැනීම උදෙසා ද කැපවුණි. විශේෂයෙන්ම මංකොල්ලකරුවන් විසින් මේ කාලය තුළ විශාල වශයෙන් බඩු භාණ්ඩ පැහැරගෙන යන ලදි.

මෙම කෝලහාලය මහනුවරින් ආරම්භ වී මාතලේ, පේරාදෙණිය, කඩුගන්නාව, ගැටඹේ, නුවරඑළිය යන ප්‍රදේශ දක්වා ව්‍යාප්ත විය. ක්‍රමයෙන් කොළඹ අවට ප්‍රදේශ වලටද කෝලහාලය පැතිර ගිය අතර 1915 ජුනි 02 වන දින වන විට මධ්‍යම, ඌව, වයඹ, සබරගමුව, බස්නාහිර යන පළාත් 5 ටම කෝලහාලයේ උණුසුම දැනිණි ( Souza 1916:8) 1915 ජූනි මස 02 වන දා වන විට රට පුරා මධ්‍යස්ථාන 106 ක ගැටුම් පැන නැගී තිබුණි. මේ අන්දමින් සීග්‍රයෙන් වර්ධනය වූ කෝලහාලය 1915 ජූනි 08 වන දා වන විට සමනය වන්නට විය. 1915 ජූනි 11 වන දින වාර්තා වූයේ සිදුවීම් එකකි. ඒ වන විට සිංහල-මුස්ලිම් ගැටුම ක්‍රමයෙන් නිමාවෙමින් පැවතුණි (බණ්ඩාර 2007:212).

1915 සිංහල- මුස්ලිම් කෝලහාලය දෙස ආණ්ඩුව බලය යෙදවූ ආකාරයත් වර්ධනයේ ස්වරූපයත් නිසා බෙදී සිටි බොහෝ ලාංකිකයින් එක්සත් කමක් අවැසිය යන මතය පිළිගන්නා ලදී. එමෙන්ම ඔවුන් 1915 ආණ්ඩුවේ ක්‍රියාකලාපයට එරෙහිව උද්ඝෝෂණය කරන ලදී. ඒ තුළින් ලාංකික නායකයන් අතර සහයෝගීතාවක් ගොඩ නැගුණි. එම අන්‍යෝන්‍ය විශ්වාසය අවසාන වශයෙන් ලංකා ජාතික සංගමය බිහි වීමට ද පදනම සකස් කර දුණි (Silva1973:92) මාර්කස් ප්‍රනාන්දු, ඊ.ජේ. සමරවික්‍රම, ජේ.ඊ. කොරයා, පී.බී. පලිපාන, එම්.ඒ. අරුපාකන්දන් වැනි එම අවදියේදී කැපී පෙනුණු බුද්ධිමතුන් විශාල පිරිසක් මේ වෙනුවෙන් සහභාගි වූහ. මූලාසනය භාරගනිමින් සභාව ඇමතූ ජේම්ස් පීරිස් 1915 සිද්ධියේදී ආණ්ඩුවේ ක්‍රියාකලාපය විවේචනයට ලක් කරමින් වැඩි දුරටත් සඳහන් කළේ අපි අවුරුදු හැත්තෑපහකට ඉතා අඩු කාලයක් මහ රජතුමාගේ රාජපාක්ෂික හා නීති අණපණත් වලට ඉතා කීකරු වූ යටත් මනුෂ්‍ය වර්ගයක්ව සිටියෙමු. අප මහද්වීපයේ මිනිසුන් මෙන් අප අතර කුමන්ත්‍රණ යෝජනා හෝ ක්‍රියාවන් හෝ කැරළි ගැසීම් හෝ වර්ගභේද නොපැවතුණේය (සිල්වා 1996:86). යනුවෙනි. එමෙන්ම ඔහු සිය කතාව අවසානයේ දී අන්‍ය කථිකයන්ට සභාව අමතන ලෙස ආරාධනා කළේය. සියල්ලන්ගේම දේශනවලින් බ්‍රිතාන්‍ය ආණ්ඩුවට තිබෙන පක්ෂපාතීත්වය පෙන්නුම් කළ අතර සාමකාමී වාතාවරණයක් තුළින් උද්ඝෝෂණයට යායුතු බව ප්‍රකාශ විය. එමෙන්ම 1915 සිද්ධියේ වගකීම ඉංග්‍රීසි ආණ්ඩුවේ ලාංකික නිලධාරීන් විසින් භාරගත යුතු බවද ප්‍රකාශ විණි. එමෙන්ම යුද්ධ කාලයේ සිදුවීම් පරීක්ෂා කරන්නට කොමිසමක් පත් කිරීම සඳහා ද යෝජනාවක් සම්මත විය. මෙම රැස්වීම 1915 සිද්ධියේදී ආණ්ඩුවේ ක්‍රියාකලාපයට විරුද්ධ වූවන් අතර ඇති වී තිබෙන එක්සත් භාවය පෙන්නුම් කළ අවස්ථාවකි (බණ්ඩාර 2007:213).

රැස්වීමේ මූලිකත්වය ජේම්ස් පීරිස්ට පැවරීමට නිර්දේශ වූයේ ඔහු ක්‍රිස්තියානි ආගමිකයෙක් වීම නිසාය. බෞද්ධ නායකයන්ට චෝදනා එල්ල වී ඇති අවස්ථාවක සිංහලයන් වෙනුවෙන් පෙනී සිටින්නට මධ්‍යස්ථ පුද්ගලයෙක් අවශ්‍ය විය. මෙම රැස්වීමට ද සිංහල පුවත් පත් මෙන්ම ඉංග්‍රීසි පුවත් පත් ද පුළුල් ප්‍රචාරයක් ලබා දෙන ලදී. රැස්වීමේදී සාකච්ඡා කල වැදගත් කරුණක් වූයේ සංදේශයක් පිළියෙල කොට එය එංගලන්ත ආණ්ඩුවට භාරදිය යුතු බවය. ඒ අනුව ඊ.ඩබ්. පෙරේරා, එච්.ජේ.සී. පෙරේරා, ජේම්ස් පීරිස්, ඊ.ටී. ද සිල්වා, ඊ.ජේ. සමරවික්‍රම වැන්නන් සංදේශයට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කරන ලදී. මෙම සංදේශය සඳහා විශාල පිරිසකගෙන් අත්සන් ලබා ගත් අතර අත්සන් කළ පුද්ගලයන්ගෙන් බහුතරය සිංහල ක්‍රිස්තියානීන් විය (සිල්වා 1996:88). '1915 ජනවාරි 16 එංගලන්තය බලා පිටත් ව ගිය ඊ.ඩබ්. පෙරේරා සහ පොන්නම්බලම් රාමනාදන් තමන් ඉදිරිපත් කරන සංදේශය සම්බන්ධව කොමිසමක් පත් කරන ලෙස යටත්විජිත ආණ්ඩුවෙන් ඉල්ලා සිටින ලදී. එම සංදේශයේ බ්‍රිතාන්‍ය නිලධාරින්ගේ අමානුෂික ක්‍රියාදාමය සැකෙවින් විස්තර කර දී තිබුණි. එංගලන්තයට ගිය ලාංකික නියෝජිතයින් දෙදෙනා බ්‍රිතාන්‍ය

රාජ්‍ය ලේකම්වරයා හමුවීමට ගත් උත්සාහය ව්‍යාවර්ථ විය. රාජ්‍ය ලේකම්වරයා හමුවීමට ලාංකික නියෝජිතයින්ට ඉඩක් නොලැබුණේ ලාංකීය නායකයින් අතර තිබූ අසමගිය හේතුවෙනි. කෝලාහලය ආරම්භ වූ මුල් දිනයේ ම මර්දනය කරලීමට හැකියාව තිබූ මෙම ගැටුම තව දුරටත් ක්‍රියාත්මක වූයේ පොලීසියේ හා හමුදාවේ අලස මෙන්ම පක්ෂග්‍රාහී කටයුතු නිසාවෙනි. කෝලාහලය රට පුරාම ව්‍යාප්ත වී එයින් සිදු විය යුතු හානි මරණ සිදුවූවායින් අනතුරුව ආණ්ඩුව එය මර්දනය කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබීය.

## ආණ්ඩුව ගැටුම මර්ධනය කිරිම.

කෝලාහලය ආරම්භ වී දින පහකට පසුව ජූනි 02 දින ආණ්ඩුව මාර්ෂල් ලෝ හෙවත් යුද්ධ නීතිය ප්‍රකාශයට පත් කළේය (Souza 1916:19). පළමුව යුධ නීතියට යටත් කරන ලද්දේ බස්නාහිර පළාතයි. නමුත් එදින ගෙවී යාමටත් පෙරම සබරගමු පළාතටද එය දීර්ඝ කරන ලදී. මෙමගින් ද සෑහීමකට පත් නොවූ ආණ්ඩුව විසින් පසු දින දකුණු, වයඹ. හා මධ්‍යම පළාත් තුනේද යුධ නීතිය ක්‍රියාත්මක කරන ලදී. උතුරු මැද පළාත හා ඌව පළාත ඉන් නිදහස් විය. ජූනි 05 වන දින වන විට රටේ පැවති කෝලාහල මුළුමනින්ම සංසිඳී ගියේය. නමුත් ජූනි 17 වන දින හිටි හැටියේම එම පළාත් දෙකද යුධ නීතියට යටත් කරන ලදී. දින 100 ක් පුරා ක්‍රියාත්මකවූ මෙකී අසාධාරණ යුධ නීතිය ජනතාවට විශාල බලපෑමක් එල්ල කරන ලදී. ජනතාව භීතියෙන් මුසපත් කල යුධ නීතියේ ඇතැම් රෙගුලාසි මෙසේ විය.

''සවස 7.00 සිට පාන්දර 5.00 දක්වා කිසිවෙකුට පාරට බැසීම තහනම් විය. මෙම නීති කඩ කරන්නන්නට දඬුවම දුටු තැන වෙඩි තැබීමය. හමුදා වාහන වලට වේගයෙන් ධාවනය කල හැකි සේ මහා මාර්ග හිස්ව තැබිය යුතුය. සොල්දාදුවන්, නගරාරක්ෂක භටයන් හෝ වෙනත් ඕනෑම අයෙකු නිල ඇඳුම් ලා සිටින විට ප්‍රශ්න කිරීමෙන් තොරව ඔවුන්ගේ අණට කීකරු විය යුතුය. එසේ අවනත නොවන්නන්ට වෙඩිතබනු ලැබිය හැකිය. කෝලාහලකරුවන්ට විරුද්ධව සාක්ෂි නොදෙන්නන්ට ද රැකවරණය දෙන්නන්ට ද දඬුවම මරණය ය. තුවක්කු පමණක් නොව අනතුරු සිදු කල හැකි ඕනෑම ආයුධයක් ළඟ තබා ගන්නන්ට ද දඬුවම මරණයයි (Souza 1916:21).

1915 ජූනි 02 සිට අගෝස්තු 30දක්වා තුන් මසක කාලයක පැවති යුධ නීතිය යටතේ මෙරට ස්වදේශිකයින් ට විඳින්නට වූ අතවර හා දිවිතොර කිරීම ප්‍රමාණය විශාලය. මෙම කාලය තුළ සිවිල් උසාවිවලට අමතරව යුධ උසාවිද ඒ ඒ ප්‍රදේශ වල පිහිටුවා තිබිණි (Fernamdo 1970:06) අවසර දී ඇති පැය ගණනින් පසු සිය නිවෙස් වලින් පිටත සිටින්නවුන් හා ඕනෑම වෙලාවක තම ගම්බිම් වලින් බැහැරව සිටින්නන් දුටුතැන වෙඩි තැබීමට නියෝගයක් පනවා තිබිණි. යුද්ධ නීතිය පැවති කාලය තුළ ගම්මුලාදෑනීන් බොහෝ දෙනෙකු සැක කර චෝදනා කර දඬුවම් දී ඇත්තේ නියමිත වගවිභාගවලින් තොරවය

(බණ්ඩාර 2007:212). එලෙස නිකරුණේ සිදු කල ඝාතනයන් පිළිබඳ ගම්බද පෙදෙස්වලින් අසන්නට ලැබිණි.

සිංහල මුස්ලිම් කෝලාහලය වැව්ලි කටයුතුවල යෙදී සිටි ඉංග්‍රීසි වැව්ලිකරුවෝද සිය වාසියට හරවා ගත්හ. ඔවුන් සිය වතු අද්දර නිවෙස් තනා සිටි ගැමියන් පන්නා දමා එම ඉඩම් කොටස් ද සිය වතු යායට එක් කර ගත්හ. මේවාට විරුද්ධ වූ අහිංසක ගැමියන්ට වෙඩි කා මිය යන්නට සිදු විය. කෝලාහල වලින් මිය ගිය මුස්ලිම් සංඛ්‍යාව 39 ක් වන විට යුධ හමුදාව හා පොලීසිය විසින් මරා දමන ලද සංඛ්‍යාව 66 ක් විය. සිවිල් විනිශ්චය සභාවලට ඉදිරිපත් කරන ලද චූදිතයන් 8408 කි න් 483 5ක් වැරදිකරුවන් අතර යුධ විනිශ්චය මණ්ඩලයට ඉදිරිපත් කල චූදිතයන් 412 කි න් 358 ක් වැරදිකරුවන් කර දඬුවම් ලබා දෙන ලදී (Souza 1916:22).

යුධ නීතිය යටතේ සිංහල බෞද්ධයන් හා හින්දු බැතිමතුන්ගේ ආගමික චර්යාවන්ට ද පහර ගසන ඉතා පහත් ක්‍රියාවන් ද ඔවුන් විසින් සිදු කරන ලදී. බෞද්ධයන් සතුන් මැරීම තදබල පාපකර්මයක් සේ සලකන විට මස් සඳහා සතුන් සපයන ලෙස බල කර සිටියහ. ගවයා ශුද්ධ වස්තුවක් ලෙස සලකා හින්දූන්ට පන්ජාබයෙන් ගෙන් වන ලද මහමදිත සොල්දාදුවන් සඳහා ගව මස් සපයන ලෙස බල කළහ. ජුනි 02 දින සිට අගෝස්තු 30 දක්වා වූ දින 100ක කාලය තුල ක්‍රියාත්මක වූ යුධ නීතිය ස්වදේශීකයන්ට භීෂණයෙන් පිරි සමයක් විය. ගණනය කල නොහැකි තරම් අතවර, දිවිතොර කිරීම්, අපහාස, පහරදීම් වලට ස්වදේශිකයන් ලක් විය. මෙවැනි සාපරාධී ක්‍රියා බ්‍රිතාන්‍ය නීතිය කෙරෙහි මිනිසුන් තුළ වූ විශ්වාසය සම්පූර්ණයෙන්ම පළුදු කිරිමට හේතු විය. (බණ්ඩාර 2007:218). මෙකී යුධ නීතිය යටතේ සිංහලයන්ට කිසිදු සහනයක් හිමි නොවීය.

1915 මර්දනයේ වැදගත්ම ලක්ෂණය වූයේ එය බෞද්ධ අමද්‍යප ව්‍යාපාරිකයන්ට විරුද්ධව එල්ලවූ ප්‍රහාරයක් බවට පත් වීමය. සිංහලයන් ගේ මෙන්ම බෞද්ධයන්ගේ අයිතාවාසිකම් හා වගකීම් ගැන තැකීමක් නොකල යටත්විජිත පාලකයෝ සිංහල හා බෞද්ධ විරෝධී ක්‍රියාමාර්ග අනුගමනය කරමින් දිවයින තුළ ස්වකීය අභිලාෂයන් ක්‍රියාත්මක කරලීමට වෙහෙස විය. එම කාර්යය ඉටුකර ගැනීමට බාධකව තිබූ ආගමික හා ජාතික සංවිධාන මර්ධනය කිරීමට පියවර ගත්හ. සිංහල මුස්ලිම් කෝලාහලය පසුබිම් කර ගත් මොවුන් විශේෂයෙන් බෞද්ධ සංවිධාන, අමද්‍යප ව්‍යාපාරය හා සම්බන්ධ ව සිටි සිංහල ජන ප්‍රධානීන් පිළිබඳවත් විශේෂ අවධානයක් යොමු කලහ. ආණ්ඩුව ප්‍රසිද්ධියක් ලබා සිටි සෑම බෞද්ධ නායකයෙකුම සිරභාරයට ගන්නට විය.

ඒ.ආර්.සේනානායක, ඩී.එස්.සේනානායක සහ ඩී.සී.සේනානායක සහ සහෝදරවරු තිදෙනා ද ඩී.බී. ජයතිලක, දොස්තර ඩී.ඒ. හේවාවිතාරණ, එඩ්මන් හේවාවිතාරණ, එච්. අමරසූරිය, වෝල්ටර් ද සිල්වා, මාර්ටිනස් සී. පෙරේරා, එල්.එම්. සමරක්කොඩි, ඒ.එම්.ඊ. මොලමුරේ, ඩී.ජේ.පී. ජයතිලක ආදීන් මේ අතර වූහ. සිංහල බෞද්ධයා, සිංහල ජාතිය, සරසවි සඳරුස, දිනමිණ, අනුරපුර

පුවත, ශ්‍රී ලංකා සිරි යන සියළුම බෞද්ධ පුවත් පත් පල කිරීම තහනම් කර ඒවායේ කතෘවරුන්ට විරුද්ධව නඩු පවරන ලදී. ක්‍රිස්තියානි පුවත් පතක් වූ ලක්ඛණ පුවත්පතේ කතෘට ද සෙසු අයට මෙන්ම ජනයා ඇවිස්සීමේ චෝදනාව මත නඩු පවරන ලදී (Silva 1967:103). සිංහල ජාතිය පුවත් පතේ කතෘ පියදාස සිරිසේන දින 68 ක් සිරභාරයේ තැබූ අතර පත්‍රයට විරුද්ධව වූ නඩුවේදී රුපියල් 160ක දඩයක්ද නියම විය (බණ්ඩාර 2007:218).

විශේෂයෙන් අමද්‍යප ව්‍යාපාරයට සම්බන්ධව සිටි සියලු ප්‍රභූවරු හා දීප ව්‍යාප්තව පැවති එම සමිති ශාඛාවල සාමාජික පිරිස්ද ඉංග්‍රීසි පාලකයන්ගේ සැකයට ගොදුරු වූහ. මෙහි ප්‍රතිඵලයක් ලෙස එෆ්. ආර්. සේනානායක , ඩී.සී. සේනානායක, ඩී.එස්. සේනානායක, ඩී.බී. ජයතිලක, යනාදී ජන නායකයන්ගේ නිවාස හා ඔවුන් පදිංචි ස්ථාන පරීක්ෂා කරන ලදී. මෙම ඛේදජනක අවස්ථාවේ පෞද්ගලික අමනාපකම් පිරිමසා ගැනීමට සිංහලයන් සිංහලයන්ට විරුද්ධව පැමිණිලි කළ අවස්ථා ද විය. එහෙත් අමද්‍යප ව්‍යාපාරයේ ප්‍රධානීන්ට විරුද්ධව චෝදනාවක් කිරීමට කිසිදු අයෙක් ඉදිරිපත් නොවීය. එසේ වුවත් යුද්ධ නීතිය යටතේ ජාතික ආගමික සමාජයීය වැනි කටයුතු වල මුල් තැනක් ගෙන සිටි සියලු දෙනාටම කිසිදු ප්‍රකාශයකින් චෝදනාවකින් තොරව අත් අඩංගුවට ගැනීමට පාලකයන් කටයුතු කළහ.

1915 ජුනි 21 වන විට අමද්‍යප ව්‍යාපාරයට නායකත්වය දුන් ප්‍රභූන් විශාල පිරිසක් අත්අඩංගුවට ගන්නා ලදී. "පියදාස සිරිසේන, නීතිඥ ජෝන්ද සිල්වා, රිචර්ඩ් සල්ගාදු, වෝල්ටර් සල්ගාදු, පී.සී.එම්. දියෙස්, හැරී දියෙස්, පී. ඇස්. තිසේරා, බොරළුගොඩ රාළහාමි, නොතාරිස් රාළහාමි, රොමානිස් පෙරේරායනාදී පුද්ගලයන් විය ( Silva 1967:103). මෙසේ අත්අඩංගුවට ගත් හා මරණ දණ්ඩනයට නියමවූ පිරිස් ඇල් හෝල් නම් ශාලාවේ සිරකර සිටියහ.

1915 ජූලි 07 වන දින සිරගත වී සිටි ජනනායකයන්ට ඉතාමත් දුක්බර දිනයක් විය. ඒ යටත් විජිත පාලකයන්ගේ අත්අඩංගුවට පත්ව සිටි එඩ්වඩ් හෙන්රි පේද්‍රිස්ට වෙඩිතබා මරණයට පත් කිරීමේ අවස්ථාවයි. අමද්‍යප ව්‍යාපාරයේ නායකයෙකු වූ අනගාරික ධර්මපාලගේ සොහොයුරු එඩ්මන්ඩ් හේවාවිතාරණ සිරගෙයි පැවති අයහපත් පරිසර තත්ත්වය තුළ වසංගත රෝගයක් වැළඳී එහිම මිය ගිය අතර ඒ වන විටද ඔහු ද යුද්ධාධිකරණය මගින් වරදකරුවෙකු කර තිබිණි. ධර්මපාලගේ කටයුතු මුල සිටම ඉංග්‍රීසි පාලකයන් සැක කළද සිංහල මුස්ලිම් අරගලය සිදු වන විට ඔහු සිටියේ ඉන්දියාවේය. 1913 දී ඉන්දියාවට ගිය ධර්මපාල මෙහි සිදු වීම් හා කලබල නිමා වූ පසුව ද මෙරටට පැමිණීමට ඉඩදීමට ලංකාණ්ඩුව අකමැති වූ හෙයින් ඉන්දියාවේ නිවාස අඩස්සියේ තබන ලදී. අමද්‍යප ව්‍යාපාරයේ හා බෞද්ධ සංවිධාන වල ප්‍රධාන නායකයින් හා සාමාජිකයින් චෝදනා වලින් තොරවම අත්අඩංගුවට ගනිමින් මරණ දණ්ඩනය නියම කරමින් බ්‍රිතාන්‍ය ආණ්ඩුව සිංහල මුස්ලිම් කෝලාහලය දරුණු ලෙස මර්දනය කිරීමට කටයුතු කළේය.

1915 සිංහල මුස්ලිම් කෝලාහලය මර්ධනය කිරීම සඳහා බ්‍රිතාන්‍ය ආණ්ඩුව අනුගමනය කරන ලද තවත් එක් පියවරක් වූයේ වන්දි අයකර ගැනීමයි. වන්දි ගෙවීමේ ක්‍රියාදාමය තුළ ආණ්ඩුව සිංහලයන් අරභයා අනුගමනය කරන ලද්දේ ඉතා අහිතකර වූ ප්‍රතිපත්තියකි. කලබල ඇති වූ ප්‍රදේශ වල වාසය කරන සියලුම සිංහලයන්ගේ ඒ සඳහා වන්දි මුදල් එකතු කල යුතු යයි තීරණය කර විශේෂ කොමසාරිස්වරු පත් කරන ලදී. එම ප්‍රදේශවල ධනවත් පුද්ගලයන්ගෙන් වැඩි වන්දියක් ලැබෙන පරිදි මුදලක් නියම කල ඔවුන් වන්දි ගෙවීම සඳහා අලාභහානී තක්සේරු කරනු ලැබූවේ නියමිත වටිනාකම්ද ඉක්මවා යන ආකාරයෙනි. බ්‍රිතාන්‍ය පාලකයින් නියම කල වන්දිවල වටිනාකම රුපියල් දස ලක්ෂ දහසක් බව වාර්තා විය (බණ්ඩාර 2007:228)

කෝලාහලය පැවති පළාත් වල සිංහල ගම්මාන වලින් වෙන් වෙන් වශයෙන් තීරණය කරනු ලැබූ වන්දි මුදල් ප්‍රදේශවාසීන්ගෙන් දඩයක් වශයෙන් අයකර ගන්නා ලද අතර වන්දි මුදල අය කිරීමද ගමින් ගමට වෙනස් විය. මෙය පොදුවේ ජනතාව මත පැටවූ බද්දක් මෙන් අයකර ගත්හ. එයට අමතරව ජී.එෆ්.ආර්. බ්‍රොව්නින් විශේෂ කොමසාරිස්ගේ අත්සනින් යුතුව සමහර පුද්ගලයන්ගෙන් පෞද්ගලිකව අයකර ගැනීම සඳහා පියවර ගැනිණි. කෝලාහල වලින් මුස්ලිම් මිනිසුන්ට මෙන්ම සිංහල මිනිසුන්ටද අලාභහානි සිදු විය. නමුත් වන්දි ගෙවනු ලැබූවේ මුස්ලිම් මිනිසුන්ට පමණි. සිංහලයන්ට වන්දි නොගෙවීමට බ්‍රිතාන්‍ය ආණ්ඩුව පෙළඹුනේ මෙකී කෝලාහලය සිංහලයන් විසින් දියත් කරන ලද බවට පැවති කටකථාවලින් මුලාවී සිටි නිසාය. මුස්ලිම්වරු ඉදිරිපත් කල ඕනෑම තක්සේරුවක් පිළිගෙන වන්දි මුදල් ගෙවීමට කටයුතු කරන ලදී.

සිංහල මුස්ලිම් කෝලාහලය වෙනුවෙන් සිංහල ගම් වලින් අය කර ගත් දඩ මුදල් වලින් සමහරක් මෙසේය (බණ්ඩාර 2007:228).

| ප්‍රදේශය | දඩ මුදල් රුපියල් |
|---|---|
| සියනෑ කෝරලයේ මැද පත්තුව කිරිකිත්ත මුල්ල | 4000.00 |
| සියනෑ කෝරලයේ ගඟබොඩ පත්තුව පූගොඩ | 6000.00 |
| සියනෑ කෝරලයේ නරන්ගස්පිටිය | 11700.00 |
| අලුබෝවිල | 8500.00 |
| නිට්ටඹුව | 35000.00 |

මේ අනුව මුස්ලිම්වරුන්ට සිදුවූ පාඩුවට වන්දි වශයෙන් කිසියම් මුදලක් නියම කල විට එම මුදල සිංහල වැසියන් විසින් ප්‍රදේශයේ කච්චේරියට ගෙවිය යුතු

විය. එසේම මුදල ගෙවිය නොහැකිනම් දේපල පිළිබඳ ඔප්පු ඇප වශයෙන් තැන්පත් කළ යුතු විය.

## 1915 කෝලාහලයෙන් පසු ජාතික ව්‍යාපාරයේ වර්ධනය

1915 සිංහල මුස්ලිම් කෝලාහලය බ්‍රිතාන්‍ය පාලනයට එරෙහිව ජාතික නායකයන් අතර ප්‍රබල එකමුතුවකට හේතු විය. මෙම අරගලයෙන් නායකයින්ට වැදගත් අත්දැකීමක් ලබා ගත හැකි විය. එනම් මෙවැනි අවස්ථාවකදී කටයුතු කිරීමට ප්‍රබල ජාතික සංවිධානයක අවශ්‍යතාව පැනනැගීමයි. මෙම අවධියේ ඉන්දියානු නිදහස් අරගලයේ බලපෑම ලාංකික නායකයින්ගේ අධිරාජ්‍ය විරෝධී අදහස් පුබුදුවාලීමට සමත් විය (Roberts 1977:XVVI). 20 වන සියවසේ මුල් දශකයේ පටන්ම සමකාලීන ඉන්දියාවේ සිදුවූ වර්ධනයන් වෙත ලාංකීක නායකයින් දැක්වූ ආකල්පය නම් සාපේක්ෂ වශයෙන් ශ්‍රී ලංකාවේ පැවති යහපත් සාමාජික ආර්ථික ආදී තත්ත්වයන් අනුව කරුණා සලකා බලන කල ආණ්ඩුක්‍රම අංශයෙන් තමන් හට සාධාරණයක් ඉෂ්ඨවී නොමැති බවත්, සමකාලීන ඉන්දියාවේ තත්ත්වයට වඩා හිතකර සමාජ පරිසරයක් ඇති ශ්‍රී ලංකාවට වඩාත් ප්‍රගතිශීලී ආණ්ඩුක්‍රම ප්‍රතිශංස්කරණ ලබා දිම සුදුසු හා අත්‍යාවශ්‍ය බවත්ය (මෙත්තානන්ද 2012:369).

ජාතික සංවිධානයක් ලෙස ඒකරාශි වීමට පෙරාතුව මෙරට ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ උද්ඝෝෂණ ව්‍යාපායරක් ආරම්භ වී තිබුණි. මුලදී මෙම ව්‍යාපාරයේ අරමුණ වූයේ මෙරට නිදහස් කර ගැනීම නොව ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් බහුතරය වැඩිකර ගැනීම හා ඡන්ද බලය පුළුල් කර ගැනීමය. ආණ්ඩු ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ මූලික ලක්ෂණය වූයේ, නොයෙකුත් සමිති සමාගම් පිහිටුවා ගෙන ගිය සාමකාමී උද්ඝෝෂණ ව්‍යාපාරයක් බවට පත් ව තිබීමත් එහි අරමුණු බහුවිධ වීමත්ය.

- සිලෝන් නැෂනල් අසොසියේෂන්
- හලාවත සංගමය
- යාපනය සංගමය
- පහතරට වැවිළි කරුවන්ගේ සංගමය

වැනි සංවිධාන මෙහිදී හඳුනා ගත හැකි වේ. මෙම සංවිධාන ගෙන ගිය අරගලය ජාතික මට්ටමින් ඇතිවූ උද්ඝෝෂණ නොවූ අතර ප්‍රාදේශීය මට්ටමේ උද්ඝෝෂණ වීම කැපී පෙනෙන ලක්ෂණයක් වීම. මේ වන විට පැවති ලංකා ජාතික සංවිධානය හුදෙක් වාර්තා කියවන්නා වූත් යෝජනා සම්මත කරන්නා වූත් සංවිධානයක් බවට පත්ව තිබුණි. ආයාචනා හා කන්නලව් තුලින් පමණක් කිසිවක් දිනා ගත නොහැකි බව පොන්නම්බලම් අරුණාචලම් වැනි නායකයින් අවබෝධ කරගෙන තිබූ නමුත් ජේම්ස් පීරිස් හා මාර්ස් ප්‍රනාන්දු වැනි

නායකයන් ලංකා ජාතික සංගමයක් පිහිටු වීමේ අදහසට එකඟ නොවූහ (සිල්වා 1977:241).

ජාතික ව්‍යාපාරය සම්බන්ධයෙන් ඉතාම පැහැදිලි වූත් නිරවද්‍ය වූත් මතයක් ඉදිරිපත් කරන ලද්දේ පොන්නම්බලම් අරුණාචලම් විසිනි. නව සංවිධානයක් පිහිටු විය යුතුය යන අදහස මුල් කරගෙන ඔහුගේ මූලිකත්වයෙන් සාකච්ඡා කිහිපයක් පැවති අතර ලංකා ප්‍රතිසංස්කරණ සංගමය නමින් සංවිධානයක් පිහිටුවීමට නිර්ණය කර ඒ සඳහා ව්‍යවස්ථාවක් ද පිළියෙල කරනු ලැබීය. 1917 අප්‍රේල් 02 වන දින ලංකා ජාතික සංවිධානයේ ආරාධනාවක් පරිදි එම සංවිධානයේ වාර්ෂික මහ සභාව පවත්වනු ලැබූ වේදිකාවේදී ම අපගේ දේශපාලන අවශ්‍යතා යන මැයෙන් පවත්වන ලද විශේෂ දේශනයෙන් ස්වකීය අදහස් පොන්නම්බලම් අරුණාචලම් විසින් ඉදිරිපත් කරන ලදී.

සිවිල් සේවයෙන් විශ්‍රාම ගත් නිලධාරියෙකු වූ අරුණාචලම් 1901 සිට සංඛ්‍යා ලේඛන අධ්‍යක්ෂ වශයෙන් සේවය කර තිබුණි. ලංකාවේ සමාජීය වෙනස්කම් පිළිබඳව ඔහුට වූයේ පෘථුල දැනුමකි. ඔහුගේ දේශනය තුළ පෙන්නා දුන් ප්‍රධාන තර්කය වූයේ ලාංකික ජනයාගේ වෙනස් වූ සමාජයීය තත්ත්වයන්ට අනුව ආණ්ඩු ක්‍රමයේද වෙනසක් අවශ්‍ය බවයි. ජනගහණය, ආයාත-නිර්යාත, ආදායම් හා වියදම්, අධ්‍යාපනය පිළිබඳ 1834 හා 1915 අතර සංඛ්‍ය දත්තයන් සන්සන්දනය කරමින් මෙම සමාජ වෙනස්වීම් විග්‍රහ කර තිබුණි. "අප ජනගහනයෙන් විශාල කොටසකට මූලික අධ්‍යාපනයක් ලබා ගැනීමේ අවසථාවක් ලැබී නැත. ජනගහණයෙන් 73.6% පමණ තරම් වන විශාල ප්‍රමාණයකට ලිවීමට හා කියවීමට නොහැකිය. ස්ත්‍රී පක්ෂය සම්බන්ධයෙන් මෙය 83.4%කි (සිල්වා 1996:238).

දරුවන් 12,000කගේ ඉරණම ඔවුන්ට ම විසදා ගැනීමට ඉඩහැර තිබේ. මීන් වැඩි සංඛ්‍යාවක් වීදිවල ඉබාගාතේ ඇවිදිති යි යනුවෙන් අරුණාචලම් පෙන්වා දෙන ලදී.

පොන්නම්බලම් අරුණාචලම්ගේ මෙම දේශනයේ වඩා වැදගත් අංගය වූයේ සංවිධානාත්මක වැඩ පිළිවෙලක් පිළිබඳව ඔහු යෙදූ අවධානයයි. එය ඔහුගේ දෙශනයේ සාර්ථකත්වය ලබා ගැනීම සඳහා අප ක්‍රමානුකූලව හා වෙහෙස මහන්සිව වැඩ කිරීමට සූදානම් විය යුතුය. වරින්වර පවත්වන රැස්වීම් වල දිගු වේගවත් කථා පවත්වා නින්දට යාම ප්‍රමාණවත් නොවේ. අඩුවෙන් කථා කර වැඩියෙන් වැඩ කිරීම ආරම්භ කල යුතුය යනුවෙන් ඉදිරිපත් කල අදහසින් ගම්‍ය වේ (Roberts 1977:18) ජාතික සංගමයක් පිහිටුවීමට ඇති අවශ්‍යතාවය හා හැකියාව පිළිබද පොන්නම්බලම් අරුනාචලම්ගේ මතය ඉදිරිපත් කර තිබුණි. කොන්ග්‍රසය ගොඩ නැගීම අරුනාචලම් ගේ එකම අභිප්‍රාය විය. නමුත් ජාතික කොන්ග්‍රසයක් ගොඩනැංවීම සම්බන්ධව ප්‍රබල විරුද්ධත්වයක් සමහර නායකයන් තුළ විය. ඒ නිසා ඔහු තම අරමුණ ඉටු කර ගැනීමට ක්‍රමානුකූල ක්‍රියාමාර්ගයක් වෙත යොමු විය.

1919 දක්වා ලාංකික මධ්‍යම පාන්තික නායකයින් විසින් ගෙන යන ලද දේශපාලන උද්ඝෝෂණ ව්‍යාපාරයේ වැදගත්ම ප්‍රතිඵලය වශයෙන් 1919 දී පිහිටුවාගත් "ලංකා ජාතික සංගමය" හැඳින්විය හැකිය. රට ජාතික ව්‍යාපාරයේ නිශ්චිත ආරම්භක අවස්ථාව වශයෙන් සලකනු ලබන්නේ එයයි. 1918 ට ප්‍රථම 19 වන සියවසේ අග භාගයේ පටන් ම නොයෙකුත් ආකාරයේ බහුවිධ සංවිධාන පිහිටුවා ගනු ලැබූව ද සෑම ජන කොටසකගේ ම පොදු එකතුවෙන් පිහිටුවා ගත් ප්‍රථම සංවිධානය වූයේ ලංකා ජාතික සංගමයයි. ලංකා ජාතික සංගමය බිහිවීම කෙරෙහි බලපෑ හේතු රාශියක් අපට හඳුනාගත හැකිය. ඒ අතර ඓතිහාසික සිදුවීම් රාශියක් පෙන්වා දිය හැකිය.

ලංකා ජාතික සංගමය බිහිවීම කෙරෙහි බලපෑ ඓතිහාසික පසුබිම අධ්‍යයනය කිරීමේ දී 1915 ට පෙර ආගමික පුනර්ජීවන ව්‍යාපාරයේ බලපෑම, අමද්‍යප ව්‍යාපාරය හා 1915 සිංහල-මුස්ලිම් කෝලාහලය බලපෑම සහ ඉන්දියානු ජාතික ව්‍යාපාරය ඇති කළ බලපෑම කෙරෙහි අවධානය යොමු කල යුතුය.

## නිගමනය

1915 සිට 1919 දක්වා ශ්‍රී ලංකාවේ දේශපාලන වෙනස්වීම් පිළිබඳව අවධානය යොමු කිරීමේදී මෙරට බ්‍රිතාන්‍ය යටත් විජිත බලය ස්ථාපිත කිරීම හා සම්බන්ධ වේ. උක්ත කාලපරිච්ඡේදයේ දේශපාලන වෙනස්වීම් පිළිබඳව අධ්‍යනයේදී මෙරට ආර්ථිකයේ ඇතිවූ පරිවර්තනය සහ ඒ මත බිහිවූ ධනේෂ්වර පංතිය කෙරෙහි අවදානය යොමු කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන බලය විසින් වැව්ළි ආර්ථිකය පදනම් වූ ධනේෂ්වර ආර්ථික ක්‍රමයන් හඳුන්වාදීමත් සමග මෙරට සමාජීය හා දේශපාලන ව්‍යුහය තුළද වැදගත් වෙනස්වීම් ගණනාවක් අතිවිය. ආර්ථික ක්ෂේත්‍රය තුළ ඇති වූ මෙම පරිවර්තනයේ ප්‍රතිඵලයක් වශයෙන් මෙරට නව සමාජ බලවේගයක් ලෙස ධනේෂ්වර පංතියේ පැන නැගීම සිදු වේ.

ධනේෂ්වර පංතියට අවශ්‍ය වූයේ ස්වකීය ආර්ථික හා සමාජ තත්ත්වයට සරිලන දේශපාලන බලතල ලබා ගැනීමය. ධනේෂ්වර පංතිය දේශපාලන නායකත්වයක් ගොඩ නගා ගැනීම කරා ප්‍රවිෂ්ඨ විමේ ආරම්භක අවස්ථාව දේශිය පුනර්ජීවන ව්‍යාපාරය හා අමද්‍යප ව්‍යාපාරය ලෙස තීරණය කළ හැක. දේශිය පුනර්ජීවන ව්‍යාපාරය ක්‍රිස්තියානි ආගමට එරෙහිව සිදු කළ ප්‍රතිචාරයක් පමණක් නොවීය. ජාතික හෝ ආගමික භේදයකින් තොරව අමද්‍යප ව්‍යාපාරයට නායකත්වය දීම තුළ සුරා පිළිවෙත පිටු දැකීම පමණක් නොව දේශපාලන ගමන්මගේ පදනමද සකස් කිරීමට අඩිතාලම දමනු ලැබීය. සමාන්‍ය ජනයා ඉංග්‍රීසි උගත් පන්තිය සමඟ සම්බන්ධ වීම මත අධිරාජ්‍ය විරෝධී හැඟීම් ජනිත කිරීම පහසු කටයුත්තක් වු බව පැහැදිළි වේ.

මෙම පසුබිම මත 1915 ට පෙර කාල පරිච්ඡේදයේදී බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයට එරෙහිව විවිධත්වයෙන් යුත් ජාතික ප්‍රබෝධයක් ගොඩ නැගෙනු දැක ගත හැක. ශ්‍රී ලාංකේය දේශපාලන වෙනස්වීම්හි තීරණාත්මක කාලපරිච්ඡේදයක් ලෙස 1915 න් පසු අවධිය මෙම අධ්‍යනයේදී හඳුනාගන්නා ලදී. 1915 සිංහල - මුස්ලිම් කෝලාහලය මර්ධනය කිරීමෙහිලා බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය ගත් ක්‍රියාමාර්ග සහ සිදුවීම් පිළිබඳ ආණ්ඩුවේ ප්‍රතිචාර මෙතෙක් දේශිය ධනේෂ්ව පංතිය බ්‍රිතාන්‍ය රජය සමග පැවති සබඳතාව දෙදරා යාමට හේතු විය. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය මේ වන විට දේශියයන්ගෙන් එල්ල වූ ප්‍රබල අභියෝගය ළෙස සලකනු ලැබුවේ අමද්‍යප ව්‍යාපාරයයි. එමෙන් ම බහුවිධ අරමුණු මත සංවිධාන ගණනාවක් බිහිවී තිබිණි. මෙම වතාවරණය බ්‍රිතාන්‍යය පාලකයින් දුටුවේ විජිතය පවත්වාගෙන යාමට බාධාවක් ලෙසිනි. මේ නිසා 1915 ගැටුම උපයෝගී කොට ගනිමින් අමද්‍යප ව්‍යාපාරය අඩපණ කිරීමටත් නැගී ආ ජාතික ප්‍රබෝධය අකර්මන්‍ය කිරීමට උත්සාහ ගන්නා ලදී.

මෙම ක්‍රියාමාර්ගය තුළ මෙරට ජාතිකත්වයේ පිබිදීම ස්ථිරවම සනිටුහන් වන බව ප්‍රකාශ කළ හැක. විශේෂයෙන්ම ස්වරාජ්‍යය උදෙසා පෙනී සිටීමේ දැඩි අවශ්‍යතාවයක් දේශිය නායකයන්ට පෙනී ගොස් තිබුණි.

1915 සිදුවීම් වළින් පසු දේශිය නායකත්වය පොදු හැඟීම සහ එක්සත්කම තුළින් ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ දිනා ගැනීමට පෙළඹුණි. පොදු හැඟීම තුළ ජාතික ඒකාග්‍රතාව ගැබ්වී තිබිණි. 1915 න් පසු ජාතික හැඟීම වර්ධනය වීම කෙරෙහි සිංහල - මුස්ලිම් ගැටුම මෙන්ම ඉන්දීය ජාතික ව්‍යාපාරයේ පසුබිම හේතු වී ඇති බව හඳුනා ගන්නා ලදි. සමකාලීනව ඉන්දීය ජාතික ව්‍යාපාරය ශක්තිමත් පදනමකින් ක්‍රියාකාරීව තිබිණි. විශේෂයෙන්ම බ්‍රිතාන්‍ය පාලනය යටතේ ඉන්දියාවට නව ආණ්ඩු ක්‍රමයක් සැකෙසෙමින් තිබීම මෙරට දේශපාලන ඉල්ලීම් තුළට නව්‍ය බලාපොරොත්තු ඇති කිරීමට සමත් වූ ක්‍රියාදාමයකි.

1915 න් පසු එළඹුණු කාලපරිච්ඡේදය මෙරට ධනේෂ්වර පංතියත් , එහි උගත් කණ්ඩායමත් තමන්ගේ සැබෑ දේශපාලන විඥානය වෙතට එළඹුණු අවධියක් ළෙස හැදින්විය හැක. පුද්ගලවාදයේ සිට සාමූහිකත්වය දක්වා පැමිණි දේශපාලන හැඟීමක් දේශිය නායකයින් තුළ තහවුරු වූයේ මෙම තත්ත්වය තුළයි. මේ අනුව දේශපාලන පරමාර්ථ අරමුණු කොට ගත් සංවිධාන රාශියක් බිහි වන බව පැහැදිලි විය.

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනයේ පාලක ප්‍රතිපත්ති මත 1915 න් පසු දේශපාලන ප්‍රතිසංස්කරණ ඉල්ලීම් වෙනස් මඟකින් ඉදිරිපත් කිරීමට දේශිය නායකයින් කටයුතු කරනු ලැබූහ. විශේෂයෙන් ම දේශපාලන බලතල අතින් තමන් දුර්වල තත්වයක සිටින බවත් ස්වකීය පරමාර්ත ඉටුකර ගැනීම සඳහා ශක්තිමත් පදනමකින් කටයුතු කළ යුතු බවට දේශිය නායකයින්ට අවබෝධ විය. මේ අනුව බහුවිධ ආර්ථික හා අරමුණු මත ගොඩ නැගී තිබූ දේශපාලන සංවිධානව ප්‍රතිසංස්කරණය කළ යුතු බව මොවුන්ගේ අදහස විය. මෙතැන්

සිට මෙරට දේශපාලන අරමුණු නව මඟක් වෙත ප්‍රවිශ්ඨ වූ බව මෙම අධ්‍යනයේදී සාකච්ඡාවට භාජනය කරන ලදී. අර්ථවත් ආන්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ දිනා ගානීමට පුළුල් ජාතික සංවිධානයක් තිබිය යුතු බවට අදහස් ඉදිරිපත් විය. මෙහි අවසන් ප්‍රතිඵලය 1919 ලංකා ජාතික සංගමය බිහි වීමයි.

## ආශ්‍රිත ග්‍රන්ථ


ඇඳගම, එම්., (1991) ***ශ්‍රී ලංකාවේ වතු ආර්ථිකයේ වර්ධනය***, කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාසය හා දේශපාලන විද්‍යා අංශයේ ප්‍රකාශන.

ජයවර්ධන, කේ., (1975) ***කම්කරු පංතියේ මුල් කාලීන විරයෝ,*** මහජන අධ්‍යාපන පොත් ප්‍රකාශන.

ජයවර්ධන, කේ., (1975) ***කරත්තකරුවන්ගේ වැඩ වර්ජනය හා ශ්‍රී ලංකාවේ කම්කරු උද්ගෝෂණයේ මුල් කාලය, 1896-1906,*** මහජන අධ්‍යාපන පොත් පෙළ.

ජයවර්ධන, කේ., (1993) ***දොස්තර මේරි රත්නම්, ශ්‍රී ලංකාවේ කාන්තා අයිතින් සඳහා පුරෝගාමී වූ කැනෙඩියානු කාන්තාවක්,*** සමාජ විද්‍යාඥයිගේ සංගමය, කොළඹ.

ජයවර්ධන, කේ., (1992) ඩොරින් වික්‍රමසිංහ: ***ශ්‍රී ලංකාවේ ජනතා අරගලයෙහි පුරෝගාමී වූ බටහිර කාන්තාවක්,*** කාන්තා අධ්‍යාපනික හා පර්යේෂණ කේන්ද්‍රය.

ජයවර්ධන, කේ., (1978) ***ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ නැගීම***, සිංහල පරිඃ ප්‍රේමලාල් කුමාරසිරි, කොළඹ.

ප්‍රනාන්දු, එල්., (1974) ***ජාතික ව්‍යාපාරය, ව්‍යවස්ථා වර්ධනය හා වාමාංශික ව්‍යාපාරයේ උපත,*** කොළඹ.

නවරත්න, බී., (2007) ***බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේ ලංකාවේ ජාතික ව්‍යාපාරය,*** ෆාස්ට් පබ්ලිකේෂන්, කොළඹ.

බණ්ඩාරගේ, ඒ., (2005) ***ශ්‍රී ලංකාවේ යටත් විජිත වාදය***, ස්ටැම්ෆර්ඩ් ලේක් ප්‍රකාශන, පන්නිපිටිය.

මෙන්ඩිස්, පී.සී., (1967) ***ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය,*** සීමාසහිත ඇපොතිකරීස් සමාගම, කොළඹ.

රොබර්ට්, එම්., (1977) ***ලංකා ජාතික සංගමයේ ලිපි ලේඛන සහ ලංකාවේ ජාති මාමක දේශපාලන ව්‍යාපාරය, 1929-1950,*** I **කාණ්ඩය**, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, කොළඹ.

විමලරත්න, කේ.ඩී.ජී., (1992) ***ලංකාවේ බ්‍රිතාන්‍ය ආධිපත්‍යය, 1796 - 1948***, රත්න ප්‍රකාශන.

සිල්වා, එම්.යු.ද., (1997) ***ශ්‍රී ලංකාවේ අණ්ඩුක්‍රම විකාශය හා ජාතික ව්‍යාපාරය, 1802-1927.* අභය ප්‍රකාශන.**

සිල්වා, කොල්වින්, ආර්.ද., (1958) ***බ්‍රිතාන්‍යයින් යටතේ පැවති ලංකාව, 1795-1833,*** *දේශපාලනමය I කොටස*, පරිః යූ.ඩී., ජයසේකර, සීමාසහිත ඇපොතිකරීස් සමාගම, කොළඹ.

Kannangara, P.D., (1996) ***The History of the Ceylon Civil Service, A study of Administrative change in Ceylon,*** Thisara Publications, Dehiwala.

Malaldoda, K., (1976) ***Buddhism in Sinhalese Society, 1750 - 1900,*** University of California Press ltd, California.

Mendis, G.C., (1933) ***The Colbrook - Camaran Papers, Documents on British Colonial policy in Ceylo, 1796 - 1833,*** Vol I, Oxford University press, Landon.

Mills, L.A., (1933) ***Ceylon Under The British Rule, 1795, 1932,*** Oxford University Press, London.

Peebles, P., (1995) ***Social Change in 19th Century Ceylon,*** Navrang, New Delhi.

Peebles, P., (1973) ***The Transformation of a Colloidal Elite,*** The Mudaliyard of Ninteeth centufy Ceylon Chicago.

Ramanadan, P., (1916) ***Riots and Matrial Law in Ceylon,*** St. Martin's Press, London.

Rathím, J.T., (1953) ***Sir Ponímbalam Aruíchalam, 1853 -1924*** , Committee, Colombo.

Roberts, M., (1982) ***Caste Contlict and Elite Formation, The Rise of a Karawa Elite in Sri Lanka, 1500-1931,*** Cambtige University press, Cambridge.

Samaraveewa, V., (1979) ***The Muslim Revivalish Movment ed.,*** M. Roberts, Collective Identities, Nationalizm and protest in Modern Sri Lanka.

Silva, Colvin, R, de., (1953) ***Ceylon under the British Occupation, 1975-1833,*** Vol I, Apothecaries co. Ltd, Colombo.

De. Silva, K.M., (1981) ***A History of Sri Lanka,*** New Delhi, Oxford university press.

De Souza, A., (1916) ***Hundred Days in Ceylon under martial law in 1915,*** The Ceylon morning leader, Colombo.